පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - චිත්‍ර

ශ්‍රේණිය - 9

දෙවන වාරය - ජුනි මස පස්වන සතිය

සැකසුම - එච්.ඒ සංජය උදය කුමාර

Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/

## සති පාසල කාර්ය පත්‍රිකාව

**පාඩම හෝ ඒකකය - වෙස් මුහුණක් නිමවමු.**

නිපුණතාව 5.0 : විවිධ මාධ්‍ය භාවිතයෙන් මූර්ති හා කැටයම් නිර්මාණය කරයි.

නිපුණතා මට්ටම 5.2 : නෙළීමේ ශිල්ප ක්‍රමය භාවිත කර උන්නත කැටයමක් නිර්මාණය කරයි.

### පෙර ඉගෙනුම් අවස්ථා/ ශිෂ්‍යා කළයුතු කාර්යන්

01. ශාන්ති කර්ම සඳහා උපයෝගි කර ගන්නා විවිධ වර්ගයේ වෙස් මුහුණු නිර්මාණ ඇතුළත් ජායාරූප, වෙස් මුහුණු නිර්මාණ හොඳින් බලන්න. (චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 9 ශ්‍රේණිය - පිටුව 38,39)


02. රෙජිෆෝම් කැටයම් නිර්මාණය කර ඇති අන්දම පිළිබඳ සැකසුන වීඩියෝ පට බලන්න. ඒ සඳහා පහත යූ ටියුබ් සබැඳි උදව් කර ගන්න. https://youtu.be/6iYNkHiWKmw

03. පහත සඳහන් පොත්පත් සොයාගෙන කියවන්න.
    චිත්‍ර කලාව-තිලකරත්න දිගන්වෙල මහතා- (පිටුව 77,64)
    චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය 9 ශ්‍රේණිය - (පිටුව 30,31,32)

04. රෙජිෆෝම් උන්නත කැටයමක් නිර්මාණය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය රැස්කර ගන්න.
    (අ) රෙජිෆෝම් කැබැල්ලක්. (අඟල් එකක ඝනකම රෙජිෆෝම් කැබැල්ලක් නම් වඩා සුදුසුයි)
    (ආ) රෙජිෆෝම් නෙළීම සඳහා භාවිතා කරණ උපකරණ, කියත් පටි වලින් සකස් කර ගත් උපකරණ හෝ කුඩා පේපර් කටරයක්.
    (ඇ) වර්ණ සහ පින්සල් ආදිය -පැස්ටල්, දියසායම්, ඉමල්ෂන් තීන්ත වැනි වතුරෙන් දිය කරණ තීන්ත පමණි

**අල්ප උන්නත කැටයමක් යනු කුමක්ද?**

යම් මාධ්‍යයක නෙළීමේ ශිල්පක්‍රමය භාවිතයෙන් අනවශ්‍ය කොටස් ඉවත් කරමින් (ඇඳ ඇති හෝ සළකුණු කර ඇති දළ සටහනේ/සැරසිල්ලේ ඝනකමට හෝ නෙළන මාධ්‍යයේ ඝනකමට සාපේක්ෂකව) හතරෙන් එකක ප්‍රමාණයක් ( 1/4, 0.25 ) උන්නතව (උඩට එසවුනු ලෙස) මතුකර දක්වා ඇති කැටයමකි.





අඟල් කාලක් නෙළීමෙන් පසු පෙනෙන අයුරු

රෙජිෆෝම් උන්නත කැටයමක් නිර්මාණය කිරීමේදී අනුගමනය කළ යුතු පියවර

01.තමන් සතුව ඇති රෙජිෆෝම්කැබැල්ලේ , මුහුණේ හෝ නිම කිරීමට අදහස් කරණ ප්‍රමාණයට වෙස්මුහුණක දළ සැලැස්මක් (රෙජිෆෝම් කැබැල්ල මත) ඇඳගන්න.

02. ඔබ ඇඳගත් දළ සැලැස්ම මත වෙස් මුහුණේ ඇති අවශ්‍ය හැඩතලයන්/ කොටස් මතු කිරීම සඳහාත් ඉවත් කළ යුතු කොටස් / අනවශ්‍ය කොටස් ඉවත් කරීම සඳහාත් ඉවත් කලයුතු කොටස් පැන්සලෙන් ලකුණු කරන්න.




03. රෙජිෆෝම් කැබැල්ලේ ඝනකම පැත්තේ අඟල් කාලක උසින් ඉරක් ඇඳ ගන්න.



04. ඉන් පසු ඉහත ලකුණු කර ගත් ඉවත් කළයුතු කොටස් කියත් පටිවලින් සකසා ගත් රෙජිෆෝම් පිහියකින් හෝ කුඩා පෙපර් කටරයකින් ඉවත් කර ගන්න. (උපකරණ භාවිතයේදී ආරක්ෂාව ගැනත් සිතන්න)

05.වැලිකඩදාසි ගෙන මතුකරගත් රෙජිෆෝම් හැඩතල දාරමත සෙමින් අතුල්ලා සුමට කරන්න්
    (වැලිකඩදාසියෙන් අතුල්ලන විට අනිවාර්යයෙන්ම මුඛආවරණ පළඳින්න)

06. වෙස් මුහුණේ හැඩය ඉතිරි වන සේ වටේ ඉරදිගේත් කපා ගන්න.



07. සුදුසු පරිදි වර්ණ කරන්න.



ඉගෙනුම් පල

- ශාකවල විවිධත්වය හා ස්වභාවය සාකච්ඡා කරයි.
- ශාකවල මූලික හැඩ රේඛාවෙන් අඳියි.
- රේඛා භාවිතයේ විවිධත්වයෙන් ශාක කොටස්වල ගතිලක්ෂණ මතු කර දක්වයි.
- විවිධ පැන්සල් සුදුසු ශිල්පක්‍රම අනුව භාවිත කරයි.
- ද්‍රව්‍ය බලා ඇඳීමට අදාළ සිද්ධාන්ත අනුගමනය කරයි.
- අනෙක් සිසුන්ගේ නිර්මාණ අගයයි.

### බාහිර ඉගෙනුම් අවස්ථා/සහායක ඉගෙනුම් ආධාරක/ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි දේ.

01. පොත්පත් - චිත්‍ර කලාව ගුරු මාර්ගෝපදේශය 9ශ්‍රේණිය (පිටුව 30,31,32)

02. යූ ටියුබ් සබැඳි - https://youtu.be/1-5lr1-pxOM

03.ඊ නැණ පියස - https://www.enenapiyasa.lk/lms/course

04. ඊ තක්සලාව - https://www.e-thaksalawa.moe.gov.lk/moodle/course

**පහත ක්‍රියාකාරකම් වල යෙදෙන්න**

01. වෙස් මුහුණු වලට අමතරව විවිධ කැටයම් රෙජිෆෝම් මත සිදු කරන්න. අල්ප උන්නත හෝ අර්ධ, අධි,හා පූර්ණ උන්නතවද අත්හදා බැලීම් කරන්න.